www.xtrapapers.com

Cambridge O Level

**Cambridge International Examinations**
Cambridge Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2015**

**1 hour 30 minutes**

INSERT

*9550146402-I*

**READ THESE INSTRUCTIONS FIRST**

This Insert contains the reading passage for use with the Question Paper.

You may annotate this Insert and use the blank spaces for planning.
The Insert is **not** assessed by the Examiner.

This document consists of **2** printed pages.

DC (NF) 104248/2
© UCLES 2015

CAMBRIDGE
International Examinations

[Turn over

www.xtrapapers.com



Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–12** on the Question Paper.

විද්‍යාල ශිෂ්‍යාව කාන්සාවෙන් තම ඔරලෝසුව දෙස බලමින් පාර දිගේ ඉක්මණින් යමින් සිටියාය. පෙර දින රාත්‍රියේ මිතුරන් සමග එළියට ගොස් සිටි ඇයට උදේ වේලාව පසුවන තුරු නින්ද ගොස් තිබුණි. ඇගේ පළමුවැනි දේශනය තිබුණේ උදේ 9.30 නිසා නිතරම පමා වී එන බසය එන තුරු බලා නොසිට ඇය පිට්ටනිය හරහා කෙටිපාරකින් යන්නට තීරණය කළාය.

ඊට පෙරදින රාත්‍රියේ ඇ මිතුරන් සමග නැරඹූ චිත්‍රපටයල තම දරුවන්ට තමන්ට වියදම් දැරිය හැකි අධ්‍යාපනයක් ලබා දීම සඳහා පළාතේ දේශපාලන අධිකාරිය සමග අරගලයක යෙදී සිටි ගම්බද මවක හා පියෙකු පිළිබඳව ය. චිත්‍රපටයේ එම පවුල අවුරුදු දෙකක සටනකින් පසු ජයගෙන තිබුණේ, තම ගමේ සියලුම දරුවන්ට අඩු වියදම් අධ්‍යාපනයක් ලබා දීමේ අයිතිය දිනා ගනිමිනි. විදුහල් ශිෂ්‍යාවගේ මිතුරෝ නොයෙක් මට්ටමේ සමාජ පසුබිම්වලට අයත් වූවෝ ය. සමහරු නගරවල හැදුණ වැඩුණ අයයි. තවත් සමහරු කුඩා ගම් හා නගරවල උපන් අයයි. ඔව්හු සියලු දෙනාම චිත්‍රපටය නරඹා සතුටු වූහ. සියලු දෙනාටම අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතියක් තිබීමේ වැදගත්කම පිළිබඳව චිත්‍රපටයේ වූ අදහස ඔව්හු ද අනුමත කළහ.

පිට්ටනියේ අනිත් කෙළවරේ වූ විදුහලට යන පාරට එක්වන පිට්ටනිය හරහා දුවද්දී ඇයට සිතුණේ ඇතැම් විට අඩිපාර අයිනේ කඩ බක්කි පවත්වාගෙන යන වෙළඳුන් හා හිඟන්නන් ද තවම පැමිණ නැතුව ඇති කියායි. එසේ සිතුණේ ඔවුන්ගේ ප්‍රශ්න හා ඉල්ලීම් නොතකා ඔවුන් පසුකර යාම අපහසු නිසාය. ඉදිරි මග දෙස යාන්තම් බැලූ විට ඇ දුටුවේ වෙළඳුන් තවමත් කඩ බක්කි විවෘත කර නොමැති බවය. එබැවින් ඇය තම ගමන ඉක්මන් කළාය. ඒත් එවිට ම පාරේ එක් පැත්තක තණකොළ අතරින් ඇයට කිසියම් හඬක් ඇසිණි. එය මුල දී ඇසුණේ සතෙකුගේ හඬක් ලෙසිනි. වට පිට බැලූ මුත් ඇයට කිසිවක් දක්නට නොලැබිණි. ඒත් යළිත් වරක් කුඩා දරුවකු හඬන්නාක් බඳු ඒ හඬ ඇයට ඇසිණි. උසට වැවී තිබූ තණකොළ දෙසට යමින් පාර අයිනේ සිට ඇය එබී බැලුවාය. පොඩි වූ කොළ පැහැති කම්බිලි රෙද්දක් තණකොළ අතර සඟවා තිබෙණු ඇය දුටුවාය. රෙද්ද තණකොලවල පාටම නිසා එය නොපෙනී යන්නට ඉඩ තිබුණත් ඒ හඬ ඇයට යළිත් ඇසිණි. වඩාත් ළඟට යමින් තණකොළ මෑත් කොට බැලූ විට කුඩා දරුවකුගේ හිසක් ඇයට දක්නට ලැබිණි.

කම්බිලියක ඔතා දරුවා අතහැර දමා ගොස් ඇති බව පැහැදිලිය. ශිෂ්‍යාව අසරණ ලෙස තම අත් ඔරලෝසුව දෙස බැලුවාය. ඇයට දේශනයට යන්නට නොලැබෙන බව පැහැදිලිය. ඒත් ඒ උදෑසන ඇ විසින් කළ යුතු වැදගත් වැඩක් තිබෙන බව ඇයට වැටහුණි. එය ඊයේ හැන්දෑවේ මිතුරන් සමග නැරඹූ චිත්‍රපටයේ පණිවිඩය හා සම්බන්ධය. ප්‍රවේසමෙන් රෙදි පොට්ටනිය ඔසවා ගත් ඇය පාර කෙළවරේ වූ තමන්ගේ කඩ බක්කිවලට බඩු ගෙනයමින් සිටි මහලු කාන්තාවන් දෙදෙනෙකුට කතා කොට ඒ පළාතේ පොලිසියට දැනුම් දීම සඳහා උදව් ලබා ගැනීමට තවත් කීප දෙනෙකුට කියන ලෙස ඉල්ලා සිටියාය.

පැය භාගයකට පසු පොලිසිය පැමිණ දරුවා ඔවුන්ගේ භාරයට ගත්තේය. චිත්‍රපටයේ වූ පණිවිඩය ගැන යළිත් සිතමින් ශිෂ්‍යාව නිවස බලා ආපසු ගමන් කළාය. ආපසු නිවසට ළඟා වූ ඇය තම අධ්‍යාපනය අවසන් වූ පසු පළාත් සභාවේ රැකියාවක් ලබා ගැනීමට තීරණය කළාය. දිළිඳු පවුල් මත පැටවී ඇති බර ලිහිල් කරන්නටත්, දරුවන්ට වැඩි වැඩියෙන් අධ්‍යාපනය ලබා දීම පහසු කිරීමටත් ඕ බලාපොරොත්තු වූවාය.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge International Examinations Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cie.org.uk after the live examination series.

Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.

© UCLES 2015